සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# යුරෝපා ඉතිහාසය - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි.
- ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු එම කොටස II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න වලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිර ඉර මත ලියන්න.

(01) (1) උතුරු මුහුද (2) මධ්‍යධරණී මුහුද (3) අත්ලාන්තික් සාගරය
(4) අරාබි මුහුද (5) බෝල්ටික් මුහුද (......)

(02) (1) මයිසීනියන් (2) සයික් ලැඩිස් (3) කැපකෝස්
(4) රෝඩ්ස් (5) බයිබර් (......)

(03) (1) ස්ත්‍රීන් (2) වහලුන් (3) පුරවැසියන්
(4) නිලධාරීන් (5) විදේශිකයන් (......)

(04) (1) පයිතගරස් (2) ටොලමි (3) ආකිමිඩීස්
(4) ඩයොක්ලිෂන් (5) ප්ලේටෝ (......)

(05) (1) සියුස් (2) හෙරානා (3) හර්කියුලිස්
(4) ජුපිටර් (5) ඇපලෝ (......)

(06) (1) දකුණු ප්‍රංශය (2) උතුරු අප්‍රිකානු ප්‍රදේශ (3) මිසරය
(4) වයඹ දිග මෙක්සිකෝව (5) සිරියාව (......)

(07) (1) ජුලියස් සීසර් (2) ඔගස්ටස් සීසර් (3) නීරෝ
(4) කැරකැල්ලා (5) හෝමර් (......)

(08) (1) සමූහාණ්ඩුව (2) සෙනට් සභාව (3) කොන්සල්වරු
(4) ට්‍රොජන් (5) ජස්ටිනියන් (......)

(09) (1) බැග්ඩෑග් (2) කයිරෝ (3) තෝල්
(4) ඩැමස්කස් (5) කොරඩෝවා (......)

(10) (1) බොහීමියන් අවධිය (2) ඩෙන්මාර්ක් අවධිය (3) ප්‍රංශ අවධිය
(4) ඉතාලි අවධිය (5) ස්වීඩන් අවධිය (......)

- **අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්න සඳහා පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගල පදයක පද එකිනෙට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

(11)
(1) බර්තොලමියුඩයස් — අප්‍රිකා මහද්වීපයේ දකුණු තුඩුව දක්වා යාත්‍රා කිරීම
(2) ක්‍රිස්ටෝපර් කොලම්බස් — බටහිර ඉන්දීය දූපත්වලට යාත්‍රා කිරීම
(3) නාවික හෙන්රි — නව ලෝකය සොයා ගැනීම
(4) වස්කෝද ගාමා — ඉන්දියාවට යාත්‍රා කිරීම
(5) ෆර්ඩිනන් මැගලන් — ලෝකය වටා යාත්‍රා කිරීම (......)

(12)
(1) ජෙරමි බෙන්තම් — උපයෝගීතා වාදය
(2) කාල් මාර්ක්ස් — කොන්සවාට් වාදය
(3) ඇඩම්ස් ස්මිත් — රාජ්‍ය නිර්බාධ වාදය
(4) රොබට් ඕවන් — සමාජවාදී ව්‍යාපාර
(5) මැකියාවෙලි — කුමාරයා (......)

(13)
(1) ඉස්ලාම් ශිෂ්ඨාචාරය — අරාබි ඉලක්කම්
(2)ඉස්ලාම් ශිෂ්ඨාචාරය — ත්‍රිකෝණ මිතික ක්‍රමය
(3) ඉස්ලාම් ශිෂ්ඨාචාරය — භෞතික විද්‍යාවේ ලම්භක ක්‍රමය දූන සිටීම
(4) ඉස්ලාම් ශිෂ්ඨාචාරය — නේවාසික රෝහල් ක්‍රමය ක්‍රියාත්මක වීම
(5) ඉස්ලාම් ශිෂ්ඨාචාරය — සල්ෆියුරික් අම්ලය සොයා ගැනීම (......)

(14)
(1) වැඩවසම් ක්‍රමය — ප්‍රවේණිය
(2) ශාස්ත්‍රීය පුනුරුදය — ග්‍රීක හා ලතින් භාෂා ඉගෙනීමේ පුනර්ජීවය
(3) නව රාජාණ්ඩු — වංශවතුන්ගේ වරප්‍රසාද
(4) ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය — ධර්මාධිකරණය
(5) ධනවාදය — බද්ධ ව්‍යාපාර සමාගම් (......)

(15)
(1) ප්‍රංශයේ ජාතික රාජ්‍යය — රිචලියු
(2) වියානා සමතය — මෙටර්නික්
(3) අයිලා ෂැපල් සම්මේලනය — පාමර්ස්ටන්
(4) තරුණ ඉතාලිය — මැසිනි
(5) බර්ලින් සම්මේලනය — බිස්මාර්ක් (......)

- **අංක 16 සිට 20 දක්වා (A), (B), (C) (D) සහ (E) වශයෙන් ප්‍රතිචාර පහක් දක්වා ඇත. මෙම ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර කවරේදැයි නිගමනය කරන්න**

(A) සහ (B) පමණක් නිවැරදි නම් ...................... 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ...................... 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ...................... 3 ද,
(D) සහ (E) පමණක් නිවැරදි නම් ...................... 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් ............. 5 ද, තිත් ඉර මත ලියන්න.

(16) මධ්‍යකාලීන යුරෝපය තුළ පැවති වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද ?
(A) කෘෂිකර්මය මත පදනම් වූ ස්වයං පෝෂිත ආර්ථිකය
(B) නාගරීකරණය
(C) විකේන්ද්‍රගත පාලනය
(D) තරගකාරීත්වය
(E) සමාජ අසමානතාවය (......)

(17) මධ්‍යතන යුගයෙන් නූතන යුගයට පරිවර්තනය වීමේදී යුරෝපයේ ඇති වූ වෙනස්කම් කවරේද ?

(A) වෙළඳ හා වාණිජ කටයුතුවල වර්ධනය

(B) ජාතික රාජ්‍යවල වර්ධනය

(C) ආගමික සහජීවනය

(D) පාප්වහන්සේගේ ආධිපත්‍ය වර්ධනය වීම

(E) විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය (......)

(18) තිස් අවුරුදු යුද්ධයට තුඩුදුන් හේතු

(A) වෙස්ට්ෆේලියා ගිවිසුමේ අඩුපාඩු

(B) ජර්මනිය එක්සත් වීම

(C) ජර්මනියේ පැවති ආගමික මතවාද

(D) ඔග්ස්බර්ග් සම්මේලනයේ අඩුපාඩු

(E) 2 වන චාර්ල් ශුද්ධ රෝම අධිරාජයා ලෙස ඔටුනු පැළඳවීම (......)

(19) පහත පුද්ගලයන් අතරින් වියානා සම්මේලනයට සහභාගී වූ යුරෝපීය නායකයෝ කවරහුද ?

(A) 18 වන ලුවී

(B) මැලියන්ඩ්

(C) කාකල්රි

(D) කැනිං

(E) ලෙනින් (......)

(20) ඉතාලිය එක්සත් කිරීම හා සම්බන්ධ සිද්ධි කවරේද ?

(A) සොල්ෆරීනෝ සටන

(B) ගැලිබෝල්ඩි විසින් සිසිලිය හා නේපල්ස් ප්‍රදේශය යටත් කිරීම

(C) ඩෙන්මාර්කයට එරෙහි පර්සියානු යුද්ධය

(D) නැපෝලියන් පාප් රාජ්‍යය ආක්‍රමණය කිරීම

(E) ඔෆ්ස්බර්ග් සාම සමථය තීරණයට පත්කිරීම (......)

- **X හා Y තීරු එකිනෙකට ගලපන විට සංයෝගය නිවැරදිව පවත්නා පිළිතුර තෝරා වරහන් තුළ ලියන්න.**

| | X | | Y |
|---|---|---|---|
| (21) (i) | ප්‍රැන්ක්පර්ට් | A | පෘතුගාලය |
| (ii) | ලිස්බන් | B | ප්‍රංශය |
| (iii) | මාර් සේල්ස් | C | පෝලන්තය |
| (iv) | බෙල් ග්‍රේඩ් | D | යුගොස්ලෝවියාව |
| (v) | වර්සෝ | E | ජර්මනිය |

(1) EABCD (2) EABDC (3) EBDCA (4) EBCDA (5) ECDBA (......)

(22) (i) තැල්වින් — A මිනිස් අයිතිවාසිකම්
(ii) ඉග්නේෂස් ලොයෙලා — B නීතියේ සාරය
(iii) මොන්ටෙස්කියු — C දාස් කැපිටාල්
(iv) තෝමස් පේන් — D ක්‍රිස්තියානි ආගමේ ආයතන
(v) කාල් මාක්ස් — E ජයුයිට් නිකාය

(1) DECBA (2) DCEAB (3) DABCE (4) DBAEC (5) DEBAC (......)

(23) (i) බොකැෂියෝ — A ඔලිවර් ට්විස්ට්
(ii) ඇඩම්ස්ස්මිත් — B යුරෝපීය
(iii) තෝමස් ටුවර් — C මයින් කාම්ෆ්
(iv) චාල්ස් ඩිකන්ස් — D ඩිකැමරන්
(v) ඇඩොල්ෆ් හිට්ලර් — E ජාතීන්ගේ ධනය

(1) DECBA (2) DCEAB (3) DABCE (4) DBAEC (5) DEBAC (......)

(24) (i) මැසිනි — A කළු කමිස හමුදාව
(ii) ගැරිබෝල්ඩි — B හෙස්ටපෝ
(iii) කොමියුනිස්ට් රුසියාව — C රතු කමිස හමුදාව
(iv) මුසලෝනි — D තරුණ ඉතාලි සංගමය
(v) නට්සි ජර්මනිය — E රතු හමුදාව

(1) DECBA (2) DCEAB (3) DABCE (4) DBAEC (5) DEBAC (......)

(25) (i) වැඩවසම් ක්‍රමය — A අධිරාජ්‍ය ගොඩනැංවීම
(ii) දේශ ගවේෂණය — B වෙස් ෆේලියා ගිවිසුම
(iii) රෙපරමාදු ව්‍යාපාරය — C ට්‍රෙන්ට් සම්මේලනය
(iv) ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය — D කැල්වින් වාදය
(v) තිස් අවුරුදු යුද්ධය — E බල විකේන්ද්‍රනය

(1) EABCD (2) EADCB (3) EDCBA (4) ECBAD (5) EBADC (......)

- **නොගැලපෙන කරුණ ඇතුලත් පිළිතුර තෝරා තිත් ඉර මත ලියන්න.**

(26) ජාතික රැළිය
(1) බල සමකේන්ද්‍රනය
(2) වංශවතුන්ගේ බලය වැඩි වීම
(3) ස්ථිර යුධ හමුදාව
(4) වෙළඳාම පුළුල් වීම
(5) වාණිජ වාදය (......)

(27) එංගලන්ත පාර්ලිමේන්තු වර්ධනය
(1) 1255 මහා අධිකාරී පත්‍රය අත්සන් කිරීම
(2) 1628 දී පළමු චාල්ස් රජු අයිවාසිකම් පිළිබඳ පෙත්සම පිළිගැනීම
(3) 1689 දී අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
(4) 1776 දී ඇමරිකානු නිදහස් සටන
(5) 1867 දී ප්‍රතිසංස්කරණ පනත සම්මත කිරීම (......)

(28) පළමුවන ලෝක යුද්ධය
(1) යුරෝපීය රටවල් සතුරු කඳවුරු දෙකකට බෙදී යාම
(2) ඔස්ට්‍රියාව ඔටුන්න හිමි කුමරු ඝාතනය ආසන්නතම සිදුවීමයි
(3) ප්‍රතිඵල ලෙස අළුත් රාජ්‍යයන් කිහිපයක් බිහි විය
(4) යුද්ධයෙන් පසු ලෝක සාමය ආරක්ෂා කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි වීම
(5) යුද්ධයෙන් ජර්මනිය පරාජය වීම (......)

(29) දෙවන ලෝක යුද්ධය වළක්වා ගැනීමට දරණ ලද ප්‍රයත්නය
(1) 1919 ජාතීන්ගේ සංගමය පිහිටු වීම
(2) 1925 ලෝකර්නෝ ගිවිසුම පිහිටුවීම
(3) 1932 හි පැවැත්වූ සම්මිලනය
(4) 1958 ටියුනික් සම්මේලනය
(5) හිට්ලර් ජර්මනියේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම (......)

(30) කාර්මික විප්ලවය
(1) එංගලන්තයේ ආරම්භ වීම
(2) කර්මාන්ත ක්‍රමය වර්ධනය වීම
(3) කම්කරු පන්තියේ නැගී ඒම
(4) පුද්ගලික ව්‍යවසාය වර්ධනය වීම
(5) පරිසර සංරක්ෂණය කිරීම (......)

- **අංක 31 සිට 35 දක්වා දී ඇති පද යුගලයන්ගෙන් එකක් නොගැලපේ. නොගැලපෙන යුගලය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

(31)
(1) මැකියාවෙලි — කුමාරයා
(2) තෝමස් හොබ්ස් — ලෙවියනාන්
(3) මොන්ටෙස්කියු — ටයින් කාම්ෆ්
(4) ඇඩම් ස්මිත් — ජාතීන්ගේ ධනය
(5) රූසෝ — සමාජ සම්මුතිය (......)

(32)
(1) ඩැනියුබ් — ගඟ
(2) කීල් — ඇළ
(3) ආදියාතික් — මුහුද
(4) සේන් — සමුද්‍ර සන්ධිය
(5) තෝසිතා — දූපත (......)

(33) (1) සැවෝයි බයගුල්ලෝ
(2) අල්සාස් ලොරේන්
(3) සාර්ඩිනියා පීඩ්මොන්ට්
(4) බර්ලින් බෝසිනියා
(5) ෂෙල්ස්විග් හොල්ස්ටයින් (......)

(34) (1) පෙත්සම්කරුවෝ බියගුල්ලෝ
(2) විග් ටෝරි
(3) රැම්සේ මැක්ඩොනල්ඩ් ප්‍රංශය
(4) ලිබරල් කොන්සර්වැටිව්
(5) ස්ටුවර්ට් 2 වන චාල්ස් (......)

(35) (1) දේශපාලන රජුගේ බලය සංකේන්ද්‍රගත වීම
(2) ආර්ථික ස්වයංපෝෂිත බව බිඳ වැටීම
(3) සමාජීය වැඩවසම් ක්‍රමය බිඳ වැටීම
(4) ආගමික පූජක සභාවේ බලය තහවුරු වීම
(5) සංස්කෘතික නිර්මාණ කලා සම්ප්‍රදාය වෙනස් වීම (......)

- **අංක 36 සිට 40 දක්වා වූ ප්‍රශ්නවල වගන්ති 2 බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය සඳහා අදාළ වගන්ති යුගලයට වඩාත්ම ගැලපෙන විග්‍රහය වගුව පදනම් කර ගනිමින් තෝරා අංකය වරහන් තුළ ලියන්න.**

| | පළමුවන වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |

| | පළමුවන වගන්තිය | දෙවන වගන්තිය | |
|---|---|---|---|
| (36) | රෝමානු කතෝලික ආගමේ දූෂිත ක්‍රියා කලාපයට එරෙහිව නව ආගමික අදහස් රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ වශයෙන් හැඳින්විය . | මාටින් ලූතර් ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට උරදුන් උගතෙකි. | (......) |
| (37) | ග්‍රීක ශිෂ්ඨාචාරයේ අගනුවර ඇකොපොලිස්ය. | ග්‍රීක ශිෂ්ඨාචාරයේ දෙවිවරුන් අතුරින් සියළු දෙවිවරුන්ගේ අධිපතියා වූයේ ඇපලෝය. | (......) |
| (38) | මුසලෝනි ඇබිසිනියාව ආක්‍රමණය කිරීම 1 වන ලෝක යුද්ධයට හේතු විය | පර්ල් වරායට එල්ල කළ ප්‍රහාරය ඇමරිකාව 2 වන ලෝක යුද්ධයට පිවිසීමට හේතු විය. | (......) |
| (39) | දේශපාලන වැඩවසම් ක්‍රමයේ දී බලය විකේන්ද්‍රිකව පැවතුනි. | 8 වන හෙන්රි විසින් එංගලන්තයේ රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ කරන ලදී. | (......) |
| (40) | උල්රිච් ස්විංග්ලි ජර්මනියේ ආගමික ප්‍රතිසංස්කරණයට නායකත්වය සැපයීය. | මෙටර්නික් ඉතාලිය එක්සත් කිරීමට ආධාර දුන් යුරෝපීය නායකයෙකි. | (......) |

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# යුරෝපා ඉතිහාසය - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **අටවැනි ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**
  **(ප්‍රශ්න අංක 08 ට පිළිතුරු සැපයීම සඳහා සිතියමක් සපයා ඇත.)**

---

(01) ජාතික රාජ්‍ය වනාහි නූතන යුගයේ ආරම්භයේ පහල වූ සුවිශේෂ දේශපාලන සංවිධානයකි.

(1) නූතන යුගය ආරම්භයේදී බිහිවූ ජාතික රාජ්‍ය දෙකක් ලියන්න (ලකුණු 02)

(2) ඒ අතුරින් එක් රටක ජාතික රාජ්‍ය වෙනුවෙන් සේවාවන් සිදු කළ පාලකයන් 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(3) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ සැකෙවින් සඳහන් කරන්න. (ලකුණු 04)

(4) යුරෝපය නූතන යුගයට අවතීර්ණයේදී දේශපාලනික පරිවර්තනයක් ලෙස ජාතික රාජ්‍ය ඇති වීම ඇති කළ බලපෑම විස්තර කරන්න. (ලකුණු 06)

(02) (1) 15 වන හා 16 වන සියවස් වලදී පෘතුගාලය හා ස්පාඤ්ඤය නිරත වූ දේශපාලන ගවේෂණය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06)

(2) ඒවායින් උදගත වූ ප්‍රතිඵල සමාලෝචනය කරන්න. (ලකුණු 08)

(03) පහත මාතෘකා වලින් 02 ක් ගැන ඓතිහාසික සටහන් ලියන්න.

(1) යුරෝපා සම්මේලනය (2) වෙස්ට් ෆේලියා ගිවිසුම

(3) පුනරුදය (4) ප්‍රතිරෙපරමාදුව (ලකුණු 14)

(04) (1) යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඇති වීමට තුඩු දුන් ආගමික, ආර්ථික හා සමාජීය සාධක කවරේද ?

(2) ආගමික ප්‍රතිසංස්කරණ මගින් ඇති වූ ප්‍රතිඵල පරීක්ෂා කරන්න. (ලකුණු 14)

(05) තිස් අවුරුදු යුද්ධය යුරෝපා ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සලකනු ලැබේ. මෙම ප්‍රකාශය පහත ක්ෂේත්‍ර ඇසුරෙන් විමසන්න.

(1) යුද්ධය ඇතිවීමට තුඩු දුන් සාධක (2) යුද්ධයේ ප්‍රධාන අවස්ථා

(3) යුද්ධයේ ප්‍රතිඵල (ලකුණු 14)

(06) ප්‍රංශ විප්ලවය වර්තමාන යුරෝපයේ විකාශනය හැඩ ගැස්වූ ඉතාමත් වැදගත් සිදුවීමකි.

(1) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩු දුන් ආසන්නම හේතුව කුමක්ද ? (ලකුණු 04)

(2) විප්ලවය ඇති වීමට පෙර ප්‍රංශයේ පැවති සමාජ ව්‍යුහය දක්වන්න (ලකුණු 06)

(3) ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා කවරේද ? (ලකුණු 04)

(07) වියානා සම්මේලනයේ අරමුණ වූයේ ප්‍රංශ විප්ලවයෙන් හා නැපෝලියන් බොනපාට් විසින් ඇති කරන ලද වෙනස් කම් ආපසු හැරවීමයි. මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 14)

(08) දී ඇති යුරෝපා සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කරන්න. ඉන් ඕනෑම දෙකක් ගැන කෙටි ඓතිහාසික සටහනක් බැගින් ලියන්න.

(1) ලිස්බන් (2) ස්විස්ටර්ලන්තය (3) පැරීසිය (4) ඕලන්දය

(5) ඩැන්සිග් (6) ඩැනියුබ් ගඟ (7) යුගොස්ලෝවියාව (8) කෝසිකා (ලකුණු 18)

# යුරෝපා සිතියම

